(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(16).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 නොවැම්බර් 15 සෙනසුරාදා**

**2025 නොවැම්බර් 21 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 15 දිනැති අංක 2458/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.13 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 8 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2) වගන්තියේ (ඩ) සහ (ණ) ඡේද යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 06 දිනැති අංක 2422/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ නියෝග,— 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 වගන්තියේ (ජ) සහ (ණ) ඡේද සහ 9 වගන්තිය සමඟ කියවිය යුතු 39 වගන්තිය යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 06 දිනැති අංක 2422/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2025 නොවැම්බර් 26 බදාදා)**

1628/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාහන අලුතින් ලියාපදිංචි කිරීමේදී, රජය විසින් නිකුත් කරන අංක තහඩු ලබාදීමේ ප්‍රමාදයක් පවතින්නේද;

(ii) එසේ නම්, එම ප්‍රමාදයට හේතු කවරේද;

(iii) 2025.10.01 දින වන විට, රජය විසින් අංක තහඩු නිකුත් කිරීම ප්‍රමාදවී ඇති රථවාහන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ප්‍රමාදය වැළැක්වීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1629/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති කෞතුක භාණ්ඩ ආරක්ෂා කර ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් තිබිය යුතු බවත්;

(ii) ජාතික කෞතුකාගාරයේ ඇති සුවිශේෂ වටිනාකම් ඇති කෞතුක භාණ්ඩවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා විශේෂ පියවර ගත යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද;

(ආ) කොළඹ ජාතික කෞතුකාගාරයේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම වෙනුවෙන්,

(i) 2025 වසරේදී වැය කර ඇති මුදල කොපමණද;

(ii) 2026 වසරේදී වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1654/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශය යටතේ, 'හරිත දුම්බර නකල්ස් ව්‍යාපෘතිය' සහ 'දුම්බර හරිත සව්බල ගැන්වීමේ ව්‍යාපෘතිය' යනුවෙන් ව්‍යාපෘති දෙකක් තිබේද;

(ii) නකල්ස් කඳුවැටිය ආශ්‍රිත ජලාධාරය හා ගංගා ද්‍රෝණි සංරක්ෂණය සඳහා 'හරිත දේශගුණික අරමුදල' (GCF) සහ 'සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය' (IUCN) මඟින් මුදල් ආධාර ලැබී තිබේද;

(iii) එසේ නම්, ආධාර මුදල සහ ආධාර ලබා දුන් ව්‍යාපෘති කවරේද;

(iv) ඉහත ආයතන මඟින් ලබා දුන් මුදල් ආධාර , සීමාසහිත මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම වෙත ලබාදී තිබේද;

(v) එසේ නම්, එම මුදල් ප්‍රමාණය හා ලබා දුන් දිනය කවරේද;

(vi) එම මුදල වැය කර සිදුකරනු ලැබූ කාර්යයන් කවරේද;

(vii) එම කාර්යයන්වල වත්මන් ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගමට අමතරව, (අ)(i) හි සඳහන් ව්‍යාපෘති මඟින් මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් වැය කරනු ලැබූ කාර්යයන් සහ ඒවායේ වත්මන් ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 28 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***